අද city edition
2023-12-07
බ්‍රහස්පතින්දා
012 / 241
RS.40/=

ගෝඨා-මෛත්‍රී ඝාතන කුමන්ත්‍රණ සිද්ධිය:

# හිටපු නි.පොලිස්පති නාලක නිදහස්



පැමිණිලිල්ල ඉදිරියට ගෙන යෑමට ප්‍රමාණවත් කරුණු නැති බව CIDය අධිකරණයට දන්වයි

>>P3

## උත්සව සමයේදී කූට වෙළෙඳුන්ගෙන් පරිස්සම් වන්න

- පාරිභෝගික කටයුතු අධිකාරිය >>P2

# දෙදෙනෙකුට දිවි අහිමි කළ බස් රියැදුරාට වසර 12ක සිරදඬුවමක්

මරණකරුවන්ගේ ඥාතීන්ට රු.ලක්ෂ 3ක් ගෙවන ලෙසත් නියෝග

ධාවනයට නුසුදුසු බස් රථයක් ධාවනයේ යෙදවූ බස් රථ හිමියාට මාස 15ක අත්හිටුවූ සිරදඬුවමක්, මියගිය පවුල්වල ඥාතීන්ට රු. ලක්ෂ 05ක වන්දියක් ගෙවීමටත් නියෝග

බස් අනතුරින් තවත් සිවුදෙනෙක් සදාකාලික ආබාධිතයන් බවට පත්වෙලා

>>P3

## බංකොලොත් රට මාස 18ක් තුළ ඉන් මුදවා ගත්තා

- ජනාධිපති රනිල් වික්‍රමසිංහ



>>P2

## මාතර අධිකරණයෙන් සොරාගත් තවත් රිවෝල්වර 2ක් සමග ව්‍යාපාරිකයන් 3ක් අත්අඩංගුවට



>>P7

## තේවල ගුණ බලන B-60 ජනවාරි 01දා සිට අනිවාර්යයි



>>P6

## හේනාවල ප්‍රා.රෝහලේ බැම්මක් කඩාවැටීමෙන් පුද්ගලයෙක් මරුට



● චමිල් රූපසිංහ

කඩුගන්නාව හේනාවල ප්‍රාදේශීය රෝහලේ ඉදි කිරීමක නිරතව සිටි පුද්ගලයකු මතට පැරණි බැම්මක් කඩා වැටීමෙන් ඔහු එම ස්ථානයේදීම මියගොස් ඇත. පෙරේදා (05දා) දහවල් 12.00 ට පමණ මෙය සිදුව තිබේ.

මෙම පුද්ගලයා තවත් කම්කරුවන් පිරිසක් සමග රෝහලේ අවදානම් සහිත පැරණි බැම්මක් ඉවත් කිරීම සඳහා ඒ ආසන්නයෙන් නව බැම්මක් ඉදි කිරීමට පස් කපමින් සිටිය දී පැරණි බැම්ම ඔහු මතට කඩා වැටී තිබෙන බව පොලිස් පරීක්ෂණ මගින් අනාවරණය වී ඇත.

පැරණි බැම්ම සමග කඩා වැටුණු පස්වලට යට වූ පුද්ගලයා බේරා ගැනීමට සෙසු කම්කරුවන් ඇතුළු පිරිස උත්සාහ කර ඇතත් එය ව්‍යවර්ථ වී තිබේ.

පස් හා ගල්වලට යටවී සිටි පුද්ගලයා පිටතට ගැනීමට පැය 1 1/2 ක පමණ කාලයක් ගතව තිබෙන අතර රෝහල් ගත කරන විටත් ඔහු මියගොස් තිබිණ.

මියගොස් ඇත්තේ පරණ පට්ටිය ප්‍රදේශයේ පදිංචි රංජිත් අබේරත්න නමැති තිස්තුන් හැවිරිදි එක්දරු පියෙකි. සිද්ධිය සම්බන්ධයෙන් කඩුගන්නාව පොලීසිය පරීක්ෂණ පවත්වයි.

## මාතර කොටුවෙන් මිනිස් අස්ථි තොගයක් හමුවෙයි >>P2




## සයින්දමරුදු මදුසා පාසලක තිබී සිසුවෙකුගේ මළසිරුරක් හමුවේ

සිසුවාගේ මරණය සැක යැයි පවසා ජනතාව මදුසාව වටලති

මදුසාවේ පාලකයා පොලිස් අත්අඩංගුවට >>P3





“රජයේ අරමුදල් පෞද්ගලිකව ව්‍යාපාරවල යොදා ගත්තා කියා ඔප්පු කළොත් මම ඉල්ලා අස්වනවා”

- විපක්ෂනායක සජිත් ප්‍රේමදාස



“කොන්ද පණ තියෙන විපක්ෂනායක කෙනෙක් නම් අද එතුමා ඉල්ලා අස්වෙන්න ඕනෑ”

- පා.ම. මහින්දානන්ද අලුත්ගමගේ >>P3

## කටුගස්තොට ශා. අන්තෝනි බාලිකාවේ තෙමහල් ගොඩනැගිල්ලක බිත්ති පිපිරී සිසුවියන් 600කට නිවාඩු >>P2



පෑලියගොඩ අන්තර් හුවමාරු මධ්‍යස්ථානය තුළ දී

## SI සිය ගිනිඅවියෙන් වෙඩි තබාගෙන සියදිවි නසාගෙන >>P2

## දඩ මුදලත් වැඩි වෙයි

● නවෝද්‍යා පවනි

නීති සංග්‍රහයට කළ සංශෝධන අනුව දඩ මුදල් වැඩි කිරීමට කැබිනට් අනුමැතිය හිමිව තිබේ.

වර්තමාන මූල්‍ය අගයන්ට සාපේක්ෂව දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් දඩ මුදල් සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පත සකස් කිරීමට 2022-12-12 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබිණ.

ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කර ඇති පනත් කෙටුම්පතට නීතිපති අවසරය ලබා දී තිබේ.

මෙම පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත් ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇත.



## කාලගුණය

උපරිම උෂ්ණත්වය

32°C අනුරාධපුර

අවම උෂ්ණත්වය

13°C නුවරඑළිය

වැසි තත්ත්වය

බස්නාහිර/ සබරගමුව/ මධ්‍යම/ උතුරුමැද පළාත් හා ගාල්ල/ මාතර දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

මීදුම් තත්ත්වය

සබරගමුව/ මධ්‍යම/ ඌව පළාත්වල උදෑසන කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් ඇති විය හැකිය.

මුහුදේ තත්ත්වය

දිවයින වටා මුහුදු ප්‍රදේශවල සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. සුළඟේ වේගය පැ.කි.මී. 20-30 පමණ වෙයි.

අද

කර්තෘ මණ්ඩලය

ලිපිනය:
අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.

දුරකථන:
2479670, 2479671

ෆැක්ස්:
2479668

විද්‍යුත් තැපෑල:
ada@wijeya.lk / adanewspaper@gmail.com

වෙළෙඳ දැන්වීම් අංශය:
011 2479 830

බෙදාහැරීමේ අංශය:
011 2479 625

දායකත්ව අංශය:
011-2479 626

අද

පාඨක අයිතීන් සුරැකීම

අද පුවත්පත ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සහයෝගය දක්වයි.

මේ පුවත්පතෙහි සේවා කරන කර්තෘ ඇතුළු පත්‍රකලාවේදීන් සියලු දෙනම 'පාඨක අයිතීන් සුරැකීම' සහ පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ක්‍රියාවට නංවන 'කර්තෘ සංසදයට' අදාල ආචාර ධර්ම සුරැකීමට නිබඳව බැඳී සිටිති. පුවත්පතේ පළකෙරෙන ප්‍රවෘත්තියක් නිසා ඔබට සිදුවන යම් අපහසුතාවක් පිළිබඳ අප පුවත්පත දැනුම්වත් කිරීමට අවස්ථාව ඇත.

ඒ පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, 'ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම' වෙතද ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
Press Complaints of Sri Lanka

96, කිරුළ පාර, කොළඹ 05.

| | |
|---|---|
| දුරකතනය | 5 353 635 |
| ෆැක්ස් | 5 335 500 |
| ඉමේල් | pccsl@pccsl.lk |
| වෙබ් | www.pccsl.lk |

# පොදුජන පෙරමුණ ඕනෑම මැතිවරණයකට සූදානම්

## ඊළඟ ජනපති සියලු දෙනාගේ සහයෝගය ලබාගත හැකි අයෙකු විය යුතුයි

### – ඇමති ප්‍රසන්න රණතුංග

● නවෝද්‍යා පවනි

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඉදිරි වසරේදී පවත්වන ඕනෑම මැතිවරණයකට මුහුණදීමට සූදානමින් සිටින බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

මෙරට ඊළඟට බලයට පත්වන ජනාධිපතිවරයා සියලු දෙනාගේ සහයෝගය ලබාගත හැකි අයෙකු වීම අනිවාර්ය බවද හෙතෙම සඳහන් කළේය.

විදුලි බිල වැඩි වීම සම්බන්ධයෙන් අදහස් පළ කරමින් ඇමතිවරයා මෙහිදී සඳහන් කළේ, ලබන වසරේ මුල් කාර්තුව වනවිට විදුලි බිලෙහි අඩු වීමක් සිදුවිය හැකි බවට අපේක්ෂා කරන බවයි.

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ඊයේ (06දා) පැවති ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ප්‍රගති සමාලෝචන රැස්වීමෙන් අනතුරුව මාධ්‍යවේදීන් මතු කළ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඇමතිවරයා මේ බව සඳහන් කළේය. මෙහිදී මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්න හා පිළිතුරු මෙසේය,

**ප්‍රශ්නය** - විදුලි බිල වැඩි වීම සම්බන්ධයෙන් මොකක්ද කියන්නේ.

**පිළිතුර** - අපි හැමෝම දන්නවා පසුගිය අවුරුද්දකට කලින් මේ රටේ මොකක්ද වුණේ කියලා. පැය 13ක් විදුලිය කපා දැමූ රටක්. ඉන්ධනවල ගැටලුවක් තිබුණා. අත්‍යවශ්‍ය බෙහෙත්වල ගැටලුවක් තිබුණා. දැන් ක්‍රමානුකූලව රට ස්ථාවර වෙමින් තිබෙනවා. අපි විශ්වාස කරනවා ජනවාරි, පෙබරවාරි මාසය වනවිට විදුලි බිල අඩු කරන්න ලැබෙයි කියලා.

**ප්‍රශ්නය** - ඔබතුමා හිතන විදියට එජාපයත් 3%ක් ගත්ත කොට්ඨාසයක්නේ පසුගිය මැතිවරණයේ

**පිළිතුර** - මම කියන්නේ ඒකයි ඊළඟට එන කුමන හෝ ජනාධිපතිවරයා එන්නේ, සියලු දෙනාගේ සහයෝගය ගන්න පුළුවන් කෙනෙක්.

# උත්සව සමයේදී කූට වෙළෙඳුන්ගෙන් පරිස්සම් වන්න

### – පාරිභෝගික කටයුතු අධිකාරිය

● ඉන්දික හේවාවිතාරණ

උත්සව සමයේදී කූට වෙළෙඳුන් ජනතාව මුළා කර භාණ්ඩ විකිණීම සිදු කළ හැකි නිසා ඒ පිළිබඳව සැලකිලිමත් වී කටයුතු කරන ලෙස පාරිභෝගික කටයුතු අධිකාරිය සඳහන් කරයි. වගකීම් ලබා දෙන භාණ්ඩ මිලදී ගැනීමේදී වගකීම් සහතිකයක් අනිවාර්යයෙන්ම ඉල්ලා සිටින ලෙසත්, භාණ්ඩ වැඩි මිලට අලෙවි කිරීම සිදුවිය හැකි නිසා අදාළ භාණ්ඩයේ ලේබලයේ සඳහන් තොරතුරු කියවා බලන ලෙසටත් ජනතාවගෙන් එම අධිකාරිය ඉල්ලා සිටියි.

රුපියල් දහසක් වටිනා භාණ්ඩය රුපියල් දෙදහසක් ලෙසට ලේබල්වල සඳහන් කර පසුව එය කතිරයකින් කපා රුපියල් එක්දහස් දෙසීයක් වැනි මිලකට අලෙවි කිරීම සිදුවිය හැකි බවත්, මේ නිසා ඇඳුම් පැළඳුම් ඇතුළු භාණ්ඩ මිලදී ගැනීමට යාමෙහිදී භාණ්ඩයේ සාමාන්‍ය මිල පිළිබඳව සැලකිලිමත් විය යුතු බවත් අධිකාරිය සඳහන් කරයි.

උත්සව සමයේදී භාණ්ඩ හිඟයක් ඇතිවිය හැකි බවට අනුමාන කර අධික ලෙස භාණ්ඩ තොග රැස් කර නොගන්නා ලෙසත් එවැනි කටයුතු සිදුකළ හොත් භාණ්ඩ හිඟයක් ඇතිවී වැඩි මිලට භාණ්ඩ අලෙවි කිරීම පවා සිදුවිය හැකි බවත් පෙන්වා දෙයි. උත්සව සමය මූලික කර ගනිමින් සියලුම දිස්ත්‍රිකයන්හි ඇති ප්‍රධාන තොග අලෙවිසැල් හා ගබඩා පරීක්ෂා කිරීමට වැටලීම් සිදුකරනු ලබන බවත් පාරිභෝගික කටයුතු අධිකාරිය සඳහන් කරයි.

මීට අමතරව පාරිභෝගිකයන් නොමඟ යවනසුලු ක්‍රියාකාරකම් වැළැක්වීම හා අත්‍යවශ්‍ය භාණ්ඩ සඟවා තබා ගන්නා ස්ථානවලට නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලබන ජනවාරි මස 15 දා දක්වා විශේෂ වැටලීම් සිදුකරන බවද පෙන්වා දෙයි. පාරිභෝගික පැමිණිලි වෙතොත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කෙටි දුරකථන අංකය වන 1977 වෙත තොරතුරු ලබා දෙන ලෙසත් ඉල්ලා සිටියි.

### පෑලියගොඩ අන්තර් හුවමාරු මධ්‍යස්ථානය තුළ දී

# SI සිය ගිනිඅවියෙන් වෙඩි තබාගෙන සියදිවි නසාගෙන

● බණ්ඩාරම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

කොළඹ පිටත වටරවුම් මාර්ගයේ පෑලියගොඩ අන්තර් හුවමාරු මධ්‍යස්ථානය තුළ දී උපපොලිස් පරීක්ෂකවරයකු සිය රාජකාරි ගිනිඅවියෙන් හිසට වෙඩි තබාගෙන මියගොස් ඇතැයි ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක් පැවැසීය. සිද්ධියෙන් මියගොස් ඇත්තේ නොච්චියාගම ගිරාබේ පදිංචිව සිටි රුවන් කුමාර නමැති 54 හැවිරිදි දෙදරු පියෙකි.

පෙරේදා 5 රාත්‍රී වෙඩිකන්ද මුදල් එකතු කිරීමේ මධ්‍යස්ථානයේ රාජකාරි සිදු කර ඊයේ (6දා) අලුයම පෑලියගොඩ අන්තර් හුවමාරු මධ්‍යස්ථානය තුළට සේවය නිම වීම සඳහා සටහන් දැමීමට පැමිණි අවස්ථාවේදී වෙඩි තබා ගැනීම සිදුකර ඇති බව එම නිලධාරියා කීය. බරපතළ තුවාල ලද උපපොලිස් පරීක්ෂකවරයා පොලිස් නිලධාරීන් විසින් කොළඹ ජාතික රෝහල වෙත රැගෙන යන විටත් මියගොස් සිට ඇතැයි රෝහල් ප්‍රකාශකයෙක් පැවසීය.

මියගිය උපපොලිස් පරීක්ෂකවරයා පරිහරණය කළ ජංගම දුරකථනයද ක්‍රියා විරහිත ව තිබූ බව පොලිස් නිලධාරියා වැඩිදුරටත් පැවසීය. පෑලියගොඩ අපරාධ පරීක්ෂණාගාර නිලධාරීන් ද පැමිණ පරීක්ෂණ පැවැත්වුවද වෙඩි තබා ගැනීමට හේතුව මෙතෙක් අනාවරණය වී නැත. පෑලියගොඩ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එන්.ඒ. කළුවිතාරණ මහතාගේ උපදෙස් මත පරීක්ෂණ පැවැත්වෙයි.




# මාතර කොටුවෙන් මිනිස් අස්ථි තොගයක් හමුවෙයි

● ක්‍රිශාන් ජීවක ජයරුක්/ චන්දන සමරවික්‍රම

මාතර කොටුවේ මැතිවරණ කාර්යාලය ඉදිරිපිට විදුලි කණුවක් සිටුවීම සඳහා වළක් කපමින් සිටි සේවකයන් පිරිසකට ඊයේ (06දා) සවස මිනිස් අස්ථි තොගයක් හමු වී තිබේ.

පසුව මාතර මැතිවරණ කාර්යාලයේ නිලධාරියෙකු විසින් ඒ පිළිබඳ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව දැනුවත් කර තිබූ අතර, ඒ අනුව ගාල්ල හා මාතර පුරා විද්‍යා ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීහු පිරිසක් එම ස්ථානයට පැමිණ මූලික පරීක්ෂණ ආරම්භ කළහ.

අඩි 4ක් පමණ ගැඹුරු වළක එම අස්ථි කොටස් තිබූ අතර, ඉපැරණි ඇණ 04ක්ද ඒවා සමග ගොඩ ගෙන තිබිණි.

එම මිනිස් අස්ථි කොටස් කුමන කාලයකට අයත්ද යන්න සෙවීමට වැඩිදුර පරීක්ෂණ සිදුකළ යුතු බව පුරාවිද්‍යා නිලධාරියෙක්



පැවසීය. තවද දැනට පවතින තත්ත්වය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට වාර්තා කොට එම ස්ථානයේ තවදුරටත් කැණීම් සිදුකරනවාද යන්න තීරණය කරන බවද ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

කෙසේ වෙතත් මෙම සිද්ධියත් සමග විදුලි කණුව සිටුවීමේ කටයුතුද තාවකාලිකව නතර කර ඇත. පොලිතීන් උර පහකට පමණ දමන ලද මිනිස් අස්ථි කොටස් වැඩිදුර පරීක්ෂණ සඳහා පුරා විද්‍යා දෙපාර්තමේන්තුව වෙත රැගෙන ගොස් තිබේ.




# බංකොලොත් රට මාස 18ක් තුළ ඉන් මුදවා ගත්තා

### – ජනාධිපති රනිල් වික්‍රමසිංහ

● නවෝද්‍යා පවනි

බංකොලොත්භාවයට පත්ව තිබූ රට මාස 18ක් වැනි කෙටි කාලයකින් බංකොලොත්භාවයෙන් මුදවා ගැනීමට හැකි වූ බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කළේය.

සියලු ක්ෂේත්‍ර නවීකරණය කරමින් රට දියුණුව කරා ගෙන යන නව ආර්ථික වැඩපිළිවෙළ එළැඹෙන ජනවාරි 01දා සිට ආරම්භ කරන බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය.

පැරණි ක්‍රමවේදය අනුව ඉදිරියට යාමෙන් රටට හෙට දවසක් නොමැති බවත්, පසුගිය වසර කිහිපය තුළ ජාතියක් ලෙස මුහුණ දුන් කටුක අත්දැකීම මතු පරපුරට උරුම කළ නොහැකි බවත් ජනාධිපතිවරයා අවධාරණය කළේය.

එබැවින් නව ආර්ථික ප්‍රතිසංස්කරණ සමග ඉදිරියට යනවා හැර වෙනත් විකල්පයක් රටට නොමැති බව පෙන්වා දුන් ජනාධිපතිවරයා ඒ සමග සියලු දෙනා එක්විය යුතු බවද සඳහන් කළේය.



ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මේ බව සඳහන් කර සිටියේ පිටකෝට්ටේ සෝලිස් හෝටලයේ ඊයේ (06දා)පැවති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ සියවස් සැමරුමට එක්වෙමිනි.

රට බංකොලොත්භාවයෙන් මුදවා ගැනීමට රාජ්‍ය ආයතන ප්‍රධානීන් මෙන්ම සේවක ප්‍රජාව සිදුකළ මෙහෙය අගය කළ ජනාධිපතිවරයා දැනට රට පත්ව තිබෙන ආර්ථික තත්ත්වය මනාව කළමනාකරණය නොකර ඉදිරියට ගියහොත් ඉදිරි දශකයේදී නැවතත් ආර්ථික අර්බුදයකට මුහුණදීමට සිදු වන බවද පෙන්වා දුන්නේය.

එම නිසා දැනට ස්ථාවරව ඇති ආර්ථිකය ඩිජිටල් ආර්ථිකයක් දක්වා ගෙන යාමට නව සැලසුම් අනුව කටයුතු කළ යුතු බවත්, එහිදී නවීන ආර්ථික ක්‍රමවේද භාවිතා කළ යුතු බවත් ජනාධිපතිවරයා පැවසීය.

ලෝක ආර්ථික අවපාතය හමුවේ බංකොලොත් වූ රටවල් අතුරින් ශ්‍රී ලංකාව සීඝ්‍රයෙන් යථා තත්ත්වයට පත් කිරීමට හැකිව තිබෙන බව ලෝක මූල්‍ය සමාගම් පවා පිළිගන්නා බවද ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ උන්නතිය වෙනුවෙන් කැපවීමෙන් සේවය කළ සේවක පිරිසකට තිළිණ ප්‍රදානය කිරීමද ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් සිදු කරන ලද අතර සියවස් සැමරුම වෙනුවෙන් රුපියල් 25ක සමරු මුද්දරයක් හා මුල්දින කවරයක් නිකුත් කිරීමද සිදු විය.

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ගීතය හා ධජය එළිදැක්වීම සහ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව ඩිජිටල්කරණය කිරීම සඳහා "ඊ තක්සේරු" ක්‍රමවේදය හඳුන්වාදීමද මෙහිදී සිදු විය.

# ත්‍යාග මුදල් හෝ ණය දෙන බව පවසා මුදල් එකතු කිරීමේ ජාවාරමක්

● ඉන්දික හේවාවිතාරණ

ත්‍යාග මුදල් හෝ ණය ලබා දෙන පවසා විවිධ පුද්ගලයන් විසින් මුදල් එකතු කිරීමේ ජාවාරම්වල නිරත වන බවට තොරතුරු ලැබී තිබෙන බවත් මෙවැනි පුද්ගලයන්ට හසුනොවන ලෙසත් මේ පිළිබඳව විමසිලිමත්ව කටයුතු කරන ලෙසත් පොලිස් මාධ්‍ය කොට්ඨාසය ජනතාවගෙන් ඉල්ලා සිටියි.

රාජ්‍ය නොවන සංවිධානයක් මුවාවෙන් ව්‍යාජ ලෙස ජනතාවගෙන් මුදල් එකතු කළ සැකකාරියන් දෙදෙනෙකු හා සැකකරුවෙකු ඇතිමලේ හා සියඹලාණ්ඩුව පොලිස් ස්ථාන විසින් අත්අඩංගුවට ගෙන තිබෙන බවද පෙන්වා දෙයි.

ඇතිමලේ ගැමුණුපුර ප්‍රදේශයේ ජනතාවට ස්වයංරැකියා සඳහා මූල්‍ය ආධාර ලබා දෙන බවට හා දරුවන්ට පොත් කට්ටල ලබාදෙන බව පවසා රාජ්‍ය නොවන සංවිධානයක සාමාජිකත්වය ලබා ගන්නා ලෙස ඉල්ලමින් රුපියල් හයසියය බැගින් මුදල් එකතු කළ සැකකාරියක් පසුගිය 05වන දින ඇතිමලේ පොලිස් ස්ථානය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකාරිය සතුව තිබී රුපියල් 26,000ක මුදලක් පොලිස් භාරයට ගෙන තිබෙන අතර මීට අමතරව මේ මස 04වන දින රුපියල් 136,000ක මුදලක් සමුපකාර බැංකුවක තැන්පත් කර තිබෙන බවට විමර්ශනවලදී අනාවරණය කර ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකාරිය 28 හැවිරිදි සියඹලාණ්ඩුව ප්‍රදේශයේ පදිංචිකාරිනියකි. මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඇතිමලේ පොලිස් ස්ථානය වැඩිදුර පරීක්ෂණ පවත්වනු ලබයි.

මේ ආකාරයටම සියඹලාණ්ඩුව මඩුගම ප්‍රදේශයේ ජනතාවගෙන් මුදල් එකතු කරන බවට ලැබුණු තොරතුරක් මත සියඹලාණ්ඩුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් පෙරේදා (05දා) සැකකාරියක් හා සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තිබෙන අතර මොවුන් භාරයේ තිබී රුපියල් 70,300ක මුදලක් සොයාගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකාරිය 32 හැවිරිදි වියේ පසුවන අතර ඇය සියඹලාණ්ඩුව ප්‍රදේශයේ පදිංචිකාරිනියකි. සැකකකරු 46 හැවිරිදි වියේ පසුවන මොනරාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර මෙම පිරිස් මේ ආකාරයට දිවයිනේ විවිධ ප්‍රදේශවල මේ වංචා සිදුකර තිබෙනවාද යන්න සොයාගැනීම සඳහා පොලීසිය විශේෂ විමර්ශනයක් ආරම්භ කර තිබේ.

# කටුගස්තොට ශා. අන්තෝනි බාලිකාවේ තෙමහල් ගොඩනැගිල්ලක බිත්ති පිපිරී සිසුවියන් 600කට නිවාඩු

● ෂේන් සෙනෙවිරත්න

කටුගස්තොට ශාන්ත අන්තෝනි බාලිකා විදුහලේ තෙමහල් ගොඩනැගිල්ලක බිත්ති හදිසියේම ඉරිතලා පුපුරාගොස් අවදානම් තත්ත්වයකට පත්වීම හේතුවෙන් එම ගොඩනැගිල්ල වසා දමා එහි අධ්‍යාපනය හදාරමින් සිටි සිසුවියන් හයසියයකට පමණ තාවකාලික නිවාඩු ලබා දී තිබේ.

එම තෙමහල් ගොඩනැගිල්ල තුළ 08, 09 සහ 11 වසරවල සිසුවියන් අධ්‍යාපනය හදාරා ඇති අතර අධික වර්ෂාවත් සමග ගොඩනැගිල්ලේ ස්ථාන කීපයක බිත්ති පුපුරා ගොස් ඇති ආකාරය දැකගත හැකිය.

පළාත් අධ්‍යාපන ලේකම් මේනක හේරත් මහතාගෙන් මේ සම්බන්ධයෙන් කළ විමසීමකදී ඔහු පැවසුවේ





මහනුවර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයේ ප්‍රධානී ඉන්දික රණවීර මහතා අදාළ ගොඩනැගිල්ල නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් පරීක්ෂණයක් සිදුකර ගොඩනැගිල්ලේ තත්ත්වය සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවීමට පියවර ගත් බවයි.

ඒ අනුව ඊයේ (06දා) ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිලධාරීන් කණ්ඩායමක් පාසලට ගොස් ගොඩනැගිල්ල පරීක්ෂා කළ බවත්, ගොඩනැගිල්ල වැඩිදුරටත් නිරීක්ෂණය කොට වාර්තාවක් ලබාදෙන තෙක් එහි පංති පැවැත්වීම අවදානම් බවට දැනුම් දුන් බවත් හෙතෙම පැවසීය.

එම ගොඩනැගිල්ලේ අධ්‍යාපනය හැදෑරූ සිසුවියන්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධාවක් නොවන ආකාරයට මාවිල්මඩ රිෂිකලා සෞන්දර්ය විද්‍යාලයට සහ මාවිල්මඩ විදුහලට අදාළ සිසුවියන් යොමු කිරීමට පියවර ගන්නා බව ද මේනක මහතා පැවසීය.

# රජයේ අරමුදල් පෞද්ගලිකව ව්‍යාපාරවල යොදා ගත්තා කියා ඔප්පු කළොත් මම ඉල්ලා අස්වනවා

## - විපක්ෂනායක සජිත් ප්‍රේමදාස



● දිනේෂ් සමරකෝන්

සංස්කෘතික කටයුතු අරමුදලේ සිදු වූ මුදල් වංචාවක් සම්බන්ධයෙන් ඊයේ (06දා) පාර්ලිමේන්තුවේදී පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් අදහස් පළ කිරීමත් සමග විවාදයක් ඇති විය.

එහිදී විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා විසින් අදාළ කරුණු ඔප්පු කරන ලෙස අභියෝග කළ අතර, එලෙස ඔප්පු කළහොත් ඉල්ලා අස්වන බවටද හෙතෙම ප්‍රකාශ කළේය.

ඒ අනුව අදාළ වාර්තාව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්දානන්ද අලුත්ගමගේ මහතා සභාගත කළ අතර, පසු එය විගණකාධිපතිවරයා ඉදිරිපත් නොකළ බවට විපක්ෂනායකවරයා ප්‍රතික්ෂේප කළේය.

මෙම අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ උණුසුම්කාරී තත්ත්වය හට ගත් අතර, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් එකිනෙකාට චෝදනා කර ගනුද දක්නට ලැබිණි.

**විපක්ෂනායක සජිත් ප්‍රේමදාස** - ලක්ෂ 16ක් සිරිකොත අලුත්වැඩියා කරන්න මධ්‍යම සංස්කෘතික අරමුදලින් හෝ වෙනත් කිසිම රාජ්‍ය ආයතනයකින් මම ලිඛිත නියෝගයක් දීලා තියෙනවා කියලා ඔප්පු කළොත් **අන්න එදාට මම ඉවත් වෙනවා.**

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්දානන්ද අලුත්ගමගේ** - ඒක තමයි විපක්ෂයට කරන ලොකුම උදව්ව. ඒක තමයි මේ පාර්ලිමේන්තුවට කරන්න ලොකුම උදව්ව.

**විපක්ෂනායක සජිත් ප්‍රේමදාස** - මම දින වකවානු සහිතව කිව්වා. මම බය වෙන්නේ මොකද? වාර්තාව ඉදිරිපත් කරන්න. වාර්තාවේ බොහොම පැහැදිලිව තියෙනවා, වගකීමෙන් මම කියනවා.

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්දානන්ද අලුත්ගමගේ** - මගේ ළඟ තියෙනවා අභ්‍යන්තර විගණන වාර්තාව.

**සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.එම්. මරික්කාර** - එතුමා විගණන වාර්තාව ගැන කියනවා නම් ඒක සභාගත කරන්න.

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්දානන්ද**

# කොන්ද පණ තියෙන විපක්ෂනායක කෙනෙක් නම් අද එතුමා ඉල්ලා අස්වෙන්න ඕනෑ

## - පා.මා. මහින්දානන්ද අලුත්ගමගේ



**අලුත්ගමගේ** - හිටපු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මහතාගේ බිරිඳට ආරක්ෂකයන් 10ක් දාලා වැටුප් ගෙව්වා කියලා විගණන වාර්තාවේ තියෙනවා. ඒකත් පැහැදිලි කරන්න. මේ විගණන වාර්තාව දෙන්න විපක්ෂනායකතුමාට.

**විපක්ෂනායක සජිත් ප්‍රේමදාස** - එවන් දෙයක් විගණන වාර්තාවේ සඳහන් වෙලා තියෙනවා නම් සභාගත කරන්න මම දැන් අස් වෙනවා. විගණන වාර්තාවේ තියෙනවා නම් මම රජයේ අරමුදල් පෞද්ගලිකව ව්‍යාපාරවලට උපයෝගී කර ගත්තා කියලා මම අයින් වෙනවා.

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්දානන්ද අලුත්ගමගේ** - මේ රටටත් මේ අයගේ පක්ෂයටත් හොඳම කාලයක්. විපක්ෂනායක අයින් වෙන්න යන්නේ. විපක්ෂනායකතුමා කිව්වා ඉදිරිපත් කළොත් ඉල්ලා අස්වෙනවා කියලා. මම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන වාර්තාව එතුමාට දුන්නා. එතුමා ඒක කියෙව්වා, වචනයක්වත් කිව්වේ නෑ. කොන්ද පණ තියෙන විපක්ෂනායක කෙනෙක් නම් අද එතුමා ඉල්ලා අස් වෙන්න ඕන.

**විපක්ෂනායක සජිත් ප්‍රේමදාස** - ඇම්බැට්ටයෝ ටිකක් දාලා හොර අභ්‍යන්තර විගණනයක් 2022දී කරලා, මට මඩ ගහන්න බොරු වාර්තා හදනවා. මේක ජාතික විගණන කාර්යාලයෙන් ආපු එකක් නෙවෙයි. මේක විගණකාධිපතිතුමා එවපු එකක් නෙවෙයි. මේක එයාලා හොරාගේ අම්මාගෙන් පේන අහන්න ලියගත්ත දෙයක්.

**බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක** - දැන් මේ වාර්තාව සභාගත කරන්න කියලා ඉල්ලුවා. ඒ වාර්තාව 2022.08.07වැනිදා කෝප් කමිටුව වෙත ලබාදී ඇත. දැන් කෝප් කමිටුවට පුළුවන් ඒ වාර්තාව සභාගත කරන්න. ඒ වගේම 2019 නොවැම්බර් මස කරන ලද වැඩවලට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා ඇත. ඒත් අනුමැතිය ලැබී නැත.

ඩෝග් ටෝක් - ප්‍රියන්ති පෙරේරා




# අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සංශෝධනය සඳහා කැබිනට් අනුමැතිය

● නවෝද්‍යා පවනි

1979 අංක 25 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සංශෝධනය සඳහා කැබිනට් අනුමැතිය ලබා දී තිබේ. අදාළ පනත සංශෝධනය කිරීම සඳහා නව පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අධිකරණ හා බන්ධනාගාර කටයුතු අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇත. හඳුනාගත් ඇතැම් අවස්ථානුගත තත්ත්වයන් යටතේ සැකකාර චූදිත තැනැත්තන් අධිකරණය ඉදිරියේ පුද්ගලිකව පෙනී සිටීමේ අවශ්‍යතාව නඩු විභාග අතරතුර දී පවා ඉවත් කළ හැකිද යන්න තීරණය කිරීම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සංශෝධනය කිරීමට මීට පෙර කැබිනට් අනුමැතිය ලබාගෙන තිබුණි.

සුවපහසු විශ්‍රාම දිවියකට ඔබ සැබැවින්ම සූදානම් ද?
මෙම QR කේතය ස්කෑන් කර, අදම සොයා දැනගන්න.

යූනියන් ඇෂුවරන්ස්

# දෙදෙනෙකුට දිවි අහිමි කළ බස් රියැදුරාට වසර 12ක සිරදඬුවමක්

**මරණකරුවන්ගේ ඥාතීන්ට රු.ලක්ෂ 3ක් ගෙවන ලෙසත් නියෝග**

**ධාවනයට නුසුදුසු බස් රථයක් ධාවනයේ යෙදවූ බස් රථ හිමියාට මාස 15ක අත්හිටවූ සිරදඬුවමක්, මියගිය පවුල්වල ඥාතීන්ට රු. ලක්ෂ 05ක වන්දියක් ගෙවීමටත් නියෝග**

**බස් අනතුරින් තවත් සිවුදෙනෙක් සදාකාලික ආබාධිතයන් බවට පත්වෙලා**

● බුද්ධිමාල් රුබේරු

අපරීක්ෂාකාරීව අධික වේගයෙන් බස් රථයක් පදවා අනතුරක් සිදුකර, මිනිපිරිය සහ මිත්තණිය මරණයට පත්කර, තවත් සිවුදෙනෙකුට බරපතළ තුවාල සිදුකිරීමේ චෝදනාවන්ට වැරැදිකරු වූ පෞද්ගලික බස් රථ රියැදුරෙකුට වසර 12ක බරපතළ වැඩසහිත සිරදඬුවම් නියම කළ කොළඹ මහාධිකරණ විනිසුරු නාමල් බණ්ඩාර බලල්ලේ මහතා ධාවනයට නුසුදුසු තත්ත්වයේ බස් රථයක් ධාවනය යෙදවීමේ චෝදනාවට වරදකරු වූ එම බස්රථයේ හිමිකරුටද, අත්හිටුවූ සිරදඬුවම් නියම කළේය. මීට වසර 16කට පෙර මිරිහාන ඇඹුල්දෙණිය හන්දියේදී සිදුවූ මෙම බස් රථ අනතුරෙන් නුගේගොඩ ජාත්‍යන්තර පාසලක පළමු වසරේ ඉගෙනුම ලැබූ මිනිපිරිය සහ ඇය පාසලට ඇරලවීමට ගිය ඇගේ මිත්තණිය මරණයට පත්වී ඇති බව නඩු විභාගයේදී හෙළිවූ අතර, විත්තිකරුට එරෙහි චෝදනා සාධාරණ සැකයකින් තොරව ඔප්පු කර ඇතැයි තීරණය කරමින් මෙලෙස දඬුවම් නියම කෙරිණ.

චෝදනාවන්ට වරදකරුවන් වීම නිසා මෙලෙස දඬුවම් නියම වූයේ, මාර්ග 119 මහරගම - නුගේගොඩ පෞද්ගලික බස් රථයක රියැදුරු වශයෙන් කටයුතු කළ කුසන්ත ගුණසේන නමැත්තාට සහ එම බස් රථයේ හිමිකරු වන චාමර චමින්ද ලියනගේ නමැත්තාටය.

2007/01/10 වැනිදා හෝ ඊට ආසන්න දිනයක මිරිහාන, ඇඹුල්දෙණිය හන්දියේ තිලක බේකරිය අසලදී අපරීක්ෂාකාරීව අධික වේගයෙන් නිසි කාර්මික තත්ත්වයේ නොමැති පෞද්ගලික බස් රථයක් පදවා අනතුරක් සිදුකර දෙදෙනෙකුට මරණ සිදුකර තවත් සිවුදෙනෙකු සදාකාලික ආබාධිතයන් බවට පත්කළ බවට චෝදනා කරමින් නීතිපතිවරයා විත්තිකරුට එරෙහිව නඩු පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පැවැති දීර්ඝ නඩු විභාගයෙන් අනතුරුව පළමු විත්තිකරුට එරෙහිව නගා තිබූ චෝදනා 10න් 04කට වරදකරු බවද දෙවැනි විත්තිකරුට එරෙහි චෝදනාවන්ට ඔහු වරදකරු බවද විනිසුරුවරයා තීරණය කළේය.

පළමු විත්තිකාර බස් රියැදුරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ අසිත විපුලනායක මහතා කරුණු දක්වමින් තම සේවාදායකයා අධික වේගයෙන් හෝ අපරීක්ෂාකාරීව රිය ධාවනය නොකළ හෙයින් දෙදරු පියෙකු වන ඔහුට ලිහිල් දඬුවමක් නියම කරන්නැයි ඉල්ලා සිටියේය.

බස් හිමිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ ගාමිණී අල්විස් මහතා කරුණු දක්වමින් තම සේවාදායකයාට ලිහිල් දඬුවම් පමුණුවන්නැයි ඉල්ලා සිටියේය. නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි රජයේ නීතිඥවරයා කරුණු දක්වමින් පෞද්ගලික බස් රථ රියැදුරන්ගේ මෙවැනි අපරීක්ෂාකාරී ක්‍රියා හේතුවෙන් වටිනා ජීවිත රැසක් දැයට අහිමිවී ඇතැයි කීය.

ඒ හෙයින් සමාජයට පාඩමක් වන ලෙස මෙම විත්තිකරුවන්ට දඬුවම් පමුණුවන්නැයි ඉල්ලා සිටියේය. කරුණු සලකා බැලූ විනිසුරුවරයා විත්තිකාර බස් රථ රියැදුරුට වසර 12ක බරපතළ වැඩසහිත සිරදඬුවම් සහ රුපියල් 18,000කට දඩයක් නියම කළ අතර, මරණකරුවන්ගේ ඥාතීන්ට රුපියල් ලක්ෂ 3ක වන්දියක් ගෙවීමට නියම කළේය. විත්තිකාර බස් රථ හිමිකරුට මාස 15ක බරපතළ වැඩ සහිත සිරදඬුවම් නියම කර, එය වසර 15කට අත්හිටුවීමටද මියගිය පවුල්වල ඥාතීන්ට රුපියල් ලක්ෂ 05ක වන්දියක් ගෙවීමටද නියම කළේය. ඊට අමතරව විත්තිකරුවන් දෙදෙනාට, වින්දිතයන් හා සාක්කිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරියට ලක්ෂ 3ක වන්දි මුදලක් ගෙවීමටද නියම කෙරිණ.

# සයින්දමරුදු කුර්ආන් මද්‍රසාවේ තිබී දරුවෙකුගේ මළසිරුරක් සොයා ගැනේ

**දරුවාගේ මරණය සැකයැයි පවසා ජනතාව මද්‍රසාව වටලයි**

**මද්‍රසාවේ පාලකයා පොලිස් අත්අඩංගුවට**





● මඩකලපුව සමූහ වාර්තාකරු ටී. එල්. ජව්ෆර්කාන්

සයින්දමරුදු ප්‍රදේශයේ කුර්ආන් මද්‍රසාවේ තිබී හමුවූ බාලවයස්කාර දරුවාගේ මළසිරුර සම්බන්ධයෙන් සැක මතු කරමින් මහජනතාව පෙරේදා (05දා) රාත්‍රියේ මද්‍රසාව වැටලූහ. කාත්තාන්කුඩි ප්‍රදේශයේ එම්.එස්.මුෂාබ් නමැති 13 හැවිරිදි සිසුවා මෙසේ මියගොස් සිටි අතර ඔහුගේ මළසිරුර සයින්දමරුදු දිසා රෝහලට රැගෙන ගොස් තිබේ. මෙම මරණය සම්බන්ධයෙන් සයින්දමරුදු පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරන අතර එම මද්‍රාසාවේ පාලකවරයාද පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. සිසුවාගේ මරණය සියදිවි නසාගැනීමක් නොවන බව පවසමින් මහජනතාව ව්‍යාකූලත්වයට පත් ව ඇති අතර මද්‍රාසා පාලකවරයාට එරෙහිව දැනටමත් පොලිස් පැමිණිලි රැසක් ඇති බවට ජනතාව චෝදනා කරති. සයින්දමරුදු පොලීසිය මද්‍රාසාවේ පූජනීයත්වය ආරක්ෂා කර ගැනීම සඳහා විසිර යන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටි අතර, මරණය සම්බන්ධයෙන් සාධාරණ පරීක්ෂණයක් කිරීමට පොලීසිය සූදානම් බවට ජනතාවට සහතික වීමෙන් පසු මහජනතාව විසිර ගියහ.

**ගෝඨා-මෛත්‍රී ඝාතන කුමන්ත්‍රණ සිද්ධිය:**

# හිටපු නි.පොලිස්පති නාලක නිදහස්

**පැමිණිල්ල ඉදිරියට ගෙන යෑමට ප්‍රමාණවත් කරුණු නැති බව CIDය අධිකරණයට දන්වයි**

● බුද්ධිමාල් රුබේරු

හිටපු ජනාධිපතිවරුන් වන ගෝඨාභය රාජපක්ෂ, මෛත්‍රීපාල සිරිසේන ඇතුළු ප්‍රභූවරුන් ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කළැයි පැවසෙන සිද්ධියෙන් හිටපු නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා මහතා නිදහස් කිරීමට කොටුව මහේස්ත්‍රාත් තිළිණ ගමගේ මහතා ඊයේ (06දා) නියෝග කළේය. මෙම සිද්ධිය සම්බන්ධයෙන් නාලක සිල්වා මහතාට එරෙහි පැමිණිල්ල ඉදිරියට ගෙන යෑම සඳහා ප්‍රමාණවත් කරුණු නොමැති බව සඳහන් කරමින් රහස් පොලිසිය කළ ඉල්ලීමක් පිළිගත් මහේස්ත්‍රාත්වරයා, එලෙස නියම කළේය. සිද්ධියට අදාළ පරීක්ෂණවල ප්‍රගතිය අධිකරණයට දැනුම්දුන් රහස් පොලීසිය විමර්ශනවල උද්ධෘත පරීක්ෂා කළ නීතිපතිවරයා සැකකරුට එරෙහි නෛතික කටයුතු ඉදිරියට පවත්වාගෙන නොයන ලෙසට උපදෙස් දුන් බව දැනුම් දුන්නේය. ඒ අනුව, මෙම සිද්ධියෙන් සැකකාර නාලක සිල්වා මහතා මුදාහැරීමට හැකියාව ඇති බව පැමිණිල්ල වෙනුවෙන් පෙනීසිටි රහස් පොලිස් නිලධාරීහු දැනුම් දුන්හ. ඉදිරිපත් වූ කරුණු සලකා බැලීමෙන් අනතුරුව සැකකරු නිදහස් කිරීමට මහේස්ත්‍රාත්වරයා නියම කළේය.

# විදුලිබිල් අර්බුද සහිත ආගමික ස්ථාන සඳහා විසඳුම් දීමේ වැඩපිළිවෙළ ජනවාරියේ සිට

## - ඇමති විදුර වික්‍රමනායක

● දිනේෂ් සමරකෝන්

විදුලි බිල හේතුවෙන් අර්බුදකාරී තත්ත්වයකට මුහුණදී සිටින ආගමික ස්ථාන සඳහා විසඳුම් ලබාදීමට විදුලිබල අමාත්‍යාංශය සමග එක්ව ඒකාබද්ධ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර ඇති බවත්, එය ජනවාරි සිට ක්‍රියාත්මක කිරීමට හැකිවෙනු ඇති බවත් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක මහතා පැවසීය.

පාර්ලිමේන්තුවේ ඊයේ (06දා) පැවති අයවැය කාරක සභා අවස්ථාවේ විවාදයේදී අදහස් පළ කරමින් හෙතෙම මේ බව සඳහන් කළේය. "අපි දන්නවා විදුලි බිල ගෙවා ගැනීමට නොහැකිව වගේම තිබෙන අධික විදුලි බිල නිසා බරපතළ තත්ත්වයන්ට ආගමික ස්ථාන මුහුණ දීලා ඉන්නවා. ඒ නිසාම තමයි ඉන්දියානු රජයත් සමග එකතු වෙලා, ඒ වගේම අපේ විදුලිබල මණ්ඩලයේ මුදලුත් යොදාගෙන අලුත් වැඩපිළිවෙළක් මේ වනවිට අලුත් විදුලිබල ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපි ඒකාබද්ධව කරන්න සූදානම් කර ගෙන යනවා. ඒක නිශ්චිතව වගේ ජනවාරි මාසයේදී ආරම්භ කරන්න පුළුවන් වෙයි."

# මාස 10 තුළ පාරිභෝගිකයන් 544,488 කගේ විදුලි සැපයුම විසන්ධි කිරීම සාමාන්‍ය තත්ත්වයක් - ලංවිම

● නවෝද්‍යා පවනි

ලංකා විදුලිබල මණ්ඩලය මෙම වසරේ පළමු මාස 10 තුළ පමණක් එහි විදුලි පාරිභෝගිකයන් 544,488 කගේ විදුලි සැපයුම විසන්ධි කළ බව විදුලිබල මණ්ඩලය නිවේදනයක් නිකුත් කරමින් පවසයි. මෙම වසරේ ඔක්තෝබර් මස අවසන් වන විට විදුලිබල මණ්ඩලයේ සමස්ත පාරිභෝගිකයන් සංඛ්‍යාව 6,998,068 ක් බවත්, වසරකට සාමාන්‍යයෙන් නව පාරිභෝගිකයන් ලක්ෂ එකහමාරක් පමණ අලුතින් එකතු වන බවත් එම මණ්ඩලය සඳහන් කරයි.

ඒ අනුව මෙම වසර තුළ 544,488ක විදුලි සැපයුම විසන්ධි කිරීම සහ නැවත සම්බන්ධතාව දීම 2019 වසර සමග සැසඳීමේදී සාමාන්‍ය තත්වයක් බවත් ලංකා විදුලිබල මණ්ඩලය වැඩිදුරටත් පවසයි.

**සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී**
**ප්‍රසිද්ධ වෙන්දේසිය**

සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී වෙතින් ලබා ගත් රන් ණය ගිවිසගත් කාල සීමාව තුල ගෙවීම් පැහැර හැරීම හේතුවෙන්, එකී රන් ණය පහසුකම් සඳහා සුරැකුම් ලෙස උකස් තබන ලද රන් භාණ්ඩ පහත සඳහන් දිනයන්හිදී පෙ.ව 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දිනයන් හා වෙන්දේසි ස්ථානය**

**දිනය : 2023/12/19**
නො.343, මාතලේ පාර, දඹුල්ල.
නො.328, රැජින හංදිය, තඹුත්තේගම.
නො.05, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර.
නො.80, යාපනය පාර, මැදවච්චිය.
නො.28 හා 30, දෙවන හරස් වීදිය, වවුනියාව.
නො.86, කන්කසන්තුරේ පාර, යාපනය.
නො.462/A, රෝහල පාර, යාපනය.
A 9 පාර, කරදිපොක්කු හංදිය අසල, කිලිනොච්චිය.
නො.15, 7 වන ඒකකය, තුන්තලයි පාර, නෙල්ලියඩි.
නො.34, කන්කසන්තුරේ පාර, චුන්නාක්කම්.
නො.498, ආර්.ඒ.ද. මෙල් මාවත, කොළඹ 03.
නො.163C/1/1, කොළඹ පාර, මීගමුව.
වික්ටර් ගොඩනැගිල්ල, හලාවත පාර, වෙන්නප්පුව.
නො.179/1/1, හෙට්ටිපොල පාර, කුලියාපිටිය.
නො.65, මහව පාර, නිකවැරටිය.
නො.42, මිහිඳු මාවත, කුරුණෑගල.
නො.140/B, කොළඹ පාර, කුරුණෑගල.
නො.311J, රංවල හංදිය, කෑගල්ල.
නො.103/C, මීගමුව පාර, ගිරිඋල්ල.

**දිනය : 2023/12/20**
නො.14, මංගල පාර, ගම්පහ.
නො.837E, තලංගම උතුර, මාළඹේ.
නො.579, ගාලු පාර, වැල්ලවත්ත.
නො.348, ගාලු පාර, පානදුර.
නො.362, කෝට්ටේ පාර, රාජගිරිය.
නො.34, හොරණ පාර, පිළියන්දල.
නො.188, පිළියන්දල පාර, මහරගම.
නො.173, රත්නපුර පාර, හොරණ.
නො.16, හයිලෙවල් පාර, හෝමාගම.
නො.546, ගාලු පාර, දකුණු කළුතර, කළුතර.
නො.29, දුම්රියපොළ පාර, දෙහිවල.
නො.30A, නාවල පාර, නුගේගොඩ.
නො. 106/1, දුටුගැමුණු වීදිය, කොහුවල.

**දිනය : 2023/12/21**
නො.64, මාකොළ පාර, කිරිබත්ගොඩ.
නො.493, මීගමුව පාර, වත්තල.
නො.120, මීගමුව පාර, ජා-ඇල.
නො.143J, නුවර පාර, කඩවත.
නො. 310/2A, ජෝර්ජ් ආර් ද සිල්වා මාවත, කොළඹ 13.
නො. 49, සයිමන්ඩ්ස් පාර, මරදාන, කොළඹ 10.
නො.115/1, නවනගර පාර, ඇඹිලිපිටිය.
මුතුකුමාරණ ගොඩනැගිල්ල, පහල වීදිය, තිස්සමහාරාමය.
නො.46/1/1, කොළඹ පාර, කලුවැල්ල, ගාල්ල.
නො.01, අනගාරික ධර්මපාල මාවත, මාතර.
නො.103, ඩී. එස්. සේනානායක මාවත, අම්පාර.
නො.131 නුවරඑළිය පාර, ගම්පොළ.
නො.271/1, පළමු මහල, කටුගස්තොට පාර, මහනුවර.
නො.186, ඩී. එස්. සේනානායක වීදිය, නුවර.
නො.18/2, පදියතලාව පාර, මහියංගනය.
නො.80, නුවර පාර, නුවර එළිය.

කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව වෙන්දේසිය අවලංගු කිරීමේ හෝ කල් දැමීමේ අයිතිය සිංගර් ෆිනෑන්ස් (ලංකා) සමාගමේ කළමණාකාරීත්වය සතු වේ.

රන් ණය කළමණාකරු
SINGER FINANCE
නො. 498, ආර් ඒ ද මෙල් මාවත, කොළඹ 03

# මාතර අධිකරණයෙන් සොරාගත් තවත් රිවෝල්වර 2ක් සමග ව්‍යාපාරිකයන් 03ක් අත්අඩංගුවට



(ක්‍රිෂාන් ජීවක ජයරුක්)

මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු බඩු ගබඩා කාමරයෙන් සොරකම් කර අපරාධ කල්ලි ඇතුළු පිටස්තර පුද්ගලයන්ට අලෙවි කර තිබූ තවත් රිවෝල්වර ගිනිඅවි දෙකක් සමග ව්‍යාපාරිකයන් තිදෙනෙකු ඊයේ (06දා) සැකපිට ප්‍රශ්න කිරීම සඳහා අත්අඩංගුවට ගත් බව මාතර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය පවසයි.

මාතර, නාදුගල හා වෙහෙරහේන යන ප්‍රදේශවලදී ඔවුන් අත්අඩංගුවට ගනු ලැබ තිබේ.

දැනට රැඳවුම් නියෝග යටතේ ප්‍රශ්න කරන එම අධිකරණයේ සේවය කළ බහු කාර්ය සංවර්ධන සේවකයන් තිදෙනාගෙන් හෙළිකර ගත් තොරතුරු අනුව එම ගිනිඅවි සමග සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇත.

එක් රිවෝල්වරයක් විදේශීය රටක නිෂ්පාදනය කර ඇති බවත් අනෙක් රිවෝල්වරය කොටස් එකතු කර මෙරට දී සාදාගත් එකක් බවත් පොලීසිය කියයි.

සැකකාර බහු කාර්ය සංවර්ධන නිලධාරීන් තිදෙනා එම ගිනිඅවි දෙක සැකකාර ව්‍යාපාරිකයන්ට විකුණා ඇත්තේ රුපියල් එක්ලක්ෂ විසි දහසකට බවද මූලික විමර්ශනවලදී අනාවරණය වී තිබේ.

එම සැකකරුවන් අදාළ ගිනිඅවි අපරාධවලට යොදාගෙන ඇත්ද යන්න පිළිබඳ දීර්ඝ විමර්ශනයක් ආරම්භ කර ඇත.

මේ වනවිට සැකකාර බහු කාර්ය සංවර්ධන නිලධාරීන් තිදෙනාගෙන් ප්‍රශ්න කිරීමේදී හෙළිකර ගත් තොරතුරු මත අධිකරණයේ නඩු බඩු ගබඩා කාමරයෙන් ටී 56 ගිනිඅවියක් ඇතුළුව ගිනිඅවි 06ක් හෙරොයින් පාර්සල් කිහිපයක් සොරකම් කොට පාතාලයට හා පිටස්තරයන්ට විකුණා ඇති බව හෙළි වී ඇත.

තවත් සොරකම් කර ඇති දේපොළ ඇත්ද යන්න සෙවීමට මේ වන විට නඩුබඩු ගබඩා කාමරයේ සංගණනයක් ආරම්භ කර තිබේ.

අනෙක් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට ද පරීක්ෂණ පවත්වා ගෙන යයි.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් මේ වනවිට පොලීසිය පුද්ගලයන් 08දෙනෙකු සැක පිට අත්අඩංගුවට ගෙන තිබෙන අතර දෙදෙනෙකු රිමාන්ඩ් භාරයට පත් කොට ඇත.

ඒ අතර සිටින සැකකාර බහු කාර්ය සංවර්ධන නිලධාරීන්ගේ දින 7 රැඳවුම් කාලය අවසන් වූ පසු ඔවුන් වෙනුවෙන් මාස 03ක් දක්වා රැඳවුම් නියෝග ලබා ගැනීමට නියමිතය.

මාතර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ මෙහෙයවයි.

# වාලම්පුරියක් රු.කෝටි 3කට අලෙවි කිරීමට තැත්කළ අයෙක් අත්අඩංගුවට

● ඇල්ල - ප්‍රසාද් රුක්මල්



ඉතා වටිනා දුර්ලභ ඝනයේ වාලම්පුරියක් රුපියල් කෝටි 3ක මුදලකට අලෙවි කිරීමට උත්සාහ කළ පුද්ගලයකු පෙරේදා (05දා) රාත්‍රියේ බදුල්ල නගරයේදී නුවරඑළිය පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරීන් විසින් අත්අඩංගුවට ගත් බව බදුල්ල පොලීසිය පවසයි.

බදුල්ල බදුලුපිටිය ප්‍රදේශයේ පදිංචි 38 හැවිරිදි පුද්ගලයෙක් මෙසේ අත්අඩංගුවට පත්ව ඇත.

පොලිස් විශේෂ කාර්ය බළකායේ නුවරඑළිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත එහි නිලධාරීන් පිරිසක් ගැනුම්කරුවන් මෙන් වෙස්වලාගෙන බදුල්ල නගරයට පැමිණ මෙම සැකකරු සමඟ එම වාලම්පුරිය රුපියල් කෝටි 3ක මුදලට මිලදී ගැනීමට කතා කර ගෙන ඇති බවත් පොලීසිය සඳහන් කළේය.

පසුව සැකකරු විසින් වාලම්පුරිය ගැනුම්කරුට විකිණීමට බදුල්ල කොස්ගස් හංදිය ප්‍රදේශයට රාත්‍රි රැගෙන ආ අවස්ථාවේ මෙසේ අත්අඩංගුවට ගත් බවද විශේෂ කාර්ය බළකා නිලධාරීහු පවසා සිටියහ.

අදාළ වාලම්පුරිය බදුල්ල තෙල්බැද්ද වත්තේ දේවස්ථානයකින් රැගෙන ආ බවට සැකකරුගෙන් සිදු කළ ප්‍රශ්න කිරීම් වලදී තොරතුරු අනාවරණය විණැයි උසස් නිලධාරියෙක් පැවසීය.

අත්අඩංගුවට පත් සැකකරු හා වාලම්පුරිය වැඩිදුර පරීක්ෂණ කටයුතු සඳහා බදුල්ල පොලීසියට බාර දී තිබේ.

බදුල්ල පොලීසිය සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

# ගල්කිස්ස හා රත්මලාන වෙරළින් කැස්බෑ සිරුරු 4ක් හමුවේ

● දෙහිවල එච්.එම්.ධර්මපාල / ගල්කිස්ස - දිලංගා ගෝමස්



ගල්කිස්ස, රත්මලාන ආශ්‍රිත වෙරළ තීරවලට ගොඩගසා තිබූ කැස්බෑ සිරුරු 04ක් ඊයේ (06දා) සොයා ගනු ලැබ තිබේ.

රත්මලාන, වෙඩිකන්ද, විහාර මාවත 31 වත්ත අසල වෙරළ තීරයට ගොඩ ගැසූ අභිරහස් ලෙස මියගිය විශාල ප්‍රමාණයේ කැස්බෑවන් තිදෙනෙකුගේ සිරුරු ප්‍රදේශවාසීන්ගේ දැනුම්දීම මත සොයා ගනු ලැබ ඇතැයි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අධවිචන ආරක්ෂක සමන් ලියනගේ මහතා පැවසීය.

මෙවර කැස්බෑවුන් බිත්තර දැමීමට වැඩි වශයෙන් වෙරළට පැමිණෙන වාරය පසුගිය සතියේ සිට ආරම්භවී ඇති බැවින් මෙම කිලෝ 50,40,30,ආදී විශාල බරක් සහිත කැස්බෑවුන් බිත්තර දැමීමට ගොඩ දෙසට පැමිණෙමින් සිටියදී ගැඹුරු මුහුදේදී අභිරහස් ලෙස මියගොස් දින කීපයකට පසු වෙරළට ගොඩ ගසන්න ඇතැයි සැකකරන බවත් සමන් ලියනගේ මහතා පැවසීය.

අදාළ සිරුරු ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ලබා දෙන තීන්දුවට අනුව ඉදිරි පරීක්ෂණ කටයුතු සඳහා බෙල්ලන්විල අත්තිඩිය වනජීවී සංරක්ෂණ කාර්යාලයට අයත් ශීත ගබඩාවල තැන්පත් කිරීමටද නියමිතය.

අදාළ සිද්ධිය පිළිබඳ ධීවරයන් විසින් සිදු කළ දැනුවත් කිරීමෙන් අනතුරුව එම ස්ථානයට පැමිණි වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු, ගල්කිස්ස පොලිස් ජීවිතාරක්ෂක අංශ, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවල නිලධාරීන් හා දෙහිවල පොලීසිය නිලධාරීන් පැමිණ පරීක්ෂණ කටයුතු සිදු කරනු ලැබ අත්තිඩිය වනජීවී රැඳවුම් මධ්‍යස්ථානයෙන් නිලධාරීන් දැනුවත් කරනු ලැබ ඇත.

මේ සමගම මුහුදුබත්වූ පර්ල් එක්ස්ප්‍රස් නැවෙන් ගිලී ඇති සුදුපාට ප්ලාස්ටික් බෝල විශේෂයද වෙරළේ තැන තැන ගොඩ ගසා ඇති බවත් ඒ නිසා මෙලෙස නිතර කැස්බෑවුන් මියයන්නට ඇතැයිද ධීවර ජනතාව කියා සිටිති.

# ළදරු පෝෂණ ආහාර, සුවසැරිය වැනි ගිලන් රථ, වෛද්‍ය උපකරණ පොහොර සඳහා වැට් බදු

## -මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති පා. මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා

● දිනේෂ් සමරකෝන්

ළදරු පෝෂණ ආහාර, සුවසැරිය වැනි ගිලන් රථ, වෛද්‍ය උපකරණ සහ පොහොර ඇතුළු විශාල ප්‍රමාණයකට අලුතින් වැට් බදු අය කිරීමට ආණ්ඩුව සූදානම් වන බවත්, ඒ සඳහා සහනයක් ලබාදෙන ලෙස මුදල් අමාත්‍යාංශයට යෝජනාවක් ඉදිරිපත් කළ බවත් මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා පැවසීය.

මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාවක් ඊයේ (06දා) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් හෙතෙම මේ බව සඳහන් කළේය. එහිදී වැඩිදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා මෙලෙස අදහස් දක්වා සිටියේය.

"අලුතෙන් වැට් එක දාලා තියෙනවා අයිතම බර ගණනකට. ඉතාමත් සුළු ප්‍රමාණයක් තමයි වැට් එකෙන් නිදහස් වෙන්නේ. රජය කියන්නේ ඔවුන්ට බදු ආදායම අත්‍යවශ්‍යයි කියලා. නමුත් අපි දිගින් දිගටම පෙන්වා දුන්නා බදු ගහද්දි ඒකට සාධාරණත්වයක් තියෙන්න ඕනෑ කියලා. ඒ අනුව යම් යම් අයිතම නැවත සලකා බලන්න කියලා කිව්වා. මූලික වශයෙන් ළදරු පෝෂණයට අවශ්‍ය දේවලටත් වැට් එක ගහලා තියෙනවා. පෝෂදායී ආහාරවලට වැට් එක ගහන එක අසාධාරණයි කියලා අපි හිතනවා. අනිත් එක පොහොරවලට වැට් එක ගහනවා. ඩීසල්වලටත් වැට් එක ගහනවා. වෛද්‍ය උපකරණවලටත් ගහනවා. සුවසැරිය වගේ ගිලන් රථවලටත් වැට් එක ගහන්න හදනවා. ගිලන් රථ, දරුවන් සම්බන්ධයෙන් වන දේවලට අත්‍යවශ්‍යයි කියලා සලකලා වැට් බදු ගහන්නේ නැතිව ඉන්නවා නම් හොඳයි කියලා අපි මුදල් අමාත්‍යාංශයට යෝජනා කළා.



ඒවගේම ආබාධිත අයගේ සහාය උපකරණවලටත් වැට් එක ගහනවා."

# රු.3200ක, අල්ලසක් ගත්තැයි කළුතර දිසා අධිකරණ සේවකයෙක් අත්අඩංගුවට

● බණ්ඩාරගම -බිමල් ශ්‍යාමන් ජයසිංහ/පානදුර -සුමිත් පොතුපිටිය

කළුතර දිසා අධිකරණයේ කාර්යාල කාර්ය සහායකයෙකු රුපියල් 3200ක් අල්ලස් වශයෙන් ලබා ගනිද්දී අත්අඩංගුවට ගත් බව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කියයි.

කළුතර දිසා අධිකරණයේ විභාග වන ඉඩම් නඩුවක නඩු තීන්දු පිටපත ලබාදීම වෙනුවෙන් රුපියල් 3000ක් සහ රජයේ ගාස්තු වශයෙන් රුපියල් 200ක මුදලක් ඇතුළුව රුපියල් 3200/= මුදලක් අවශ්‍ය බව පවසා එම මුදල උසාවි සංකීර්ණය තුළදී ලබා ගනිද්දී අත්අඩංගුවට ගත් බව එම කොමිෂන් සභාව කියයි.

අත්අඩංගුවට ගත් සැකකරු මාවනැල්ල පදිංචිකරුවෙකි. සැකකරු කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පරීක්ෂණ පවත්වයි.

# අඩක් ඉදිකර ලද ගොඩනැගිල්ලක තිබූ අත්බෝම්බයක් හමුවේ

● ගල්කිස්ස - දිලංගා ගෝමස්



දෙහිවල අනගාරික ධර්මපාල මාවතේ අඩක් ඉදිකර අතහැර දමා ඇති මහල් 11කින් සමන්විත ගොඩනැගිල්ලක තිබූ ජීව අත්බෝම්බයක් ඊයේ (06දා) සොයාගත් බව දෙහිවල පොලීසිය සඳහන් කරයි.

අදාළ ගොඩනැගිල්ලේ 05වැනි මහලේ නිල් පැහැති පොලිතින් බෑගයක බහාලන ලද අත්බෝම්බයක් වැනි යමක් ඇති බවට එහි ආරක්ෂක නිලධාරියා විසින් දෙහිවල පොලිස් ස්ථානය දැනුවත් කිරීමෙන් අනතුරුව එහි නිලධාරීන් පිරිසක් අදාළ ස්ථානයට පැමිණ විමර්ශන ආරම්භ කර තිබිණි.

අදාළ බෝම්බය සම්බන්ධයෙන් බෝම්බ නිෂ්ක්‍රීය අංශය දැනුවත් කිරීමෙන් අනතුරුව බෝම්බ නිෂ්ක්‍රීය අංශය විසින් අත් බෝම්බය රැගෙන යන ලදී.

දෙහිවල පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

# මහනුවර සහකාර ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය පිහිටුවා වසර සියයයි

## - සමරු මුද්දරයක් ඉන්දියානු තොරතුරු පියස විවෘත කිරීම අද

● ෂේන් සෙනෙවිරත්න

මහනුවර සහකාර ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය පිහිටුවා වසර සියයක් පිරීම නිමිත්තෙන් සමරු මුද්දරයක් නිකුත් කිරීම හා ඊට සමගාමීව ඉන්දියානු තොරතුරු පියස (ඉන්දියා කෝනර්) විවෘත කිරීම අද (07)පෙ.ව. 9.30 ට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේදී සිදු කෙරේ.

මෙම උත්සව දෙකෙහිම ප්‍රධාන ආරාධිතයන් ලෙස ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස් ගෝපාල් බග්ලේ මහතා සහ මහනුවර සහකාර ඉන්දීය මහකොමසාරිස් වෛද්‍ය අතීරා එස්. මෙනෙවිය සහභාගිවීමට නියමිතය.

ඉන්දීය තොරතුරු පියස විවෘත කිරීම පෙරවරු 8.45ට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එම්.ඩී. ළමාවංශ මහතාගේ ප්‍රධානත්වයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේදී පැවැත්වෙන අතර සමරු මුද්දරය එළිදැක්වීම පෙරවරු 10.30ට මහනුවර අම්පිටිය ගෝල්ඩන් ක්‍රවුන් හෝටලයේදී පැවැත්වේ.

කඳුකරයේ වතුකම්කරුවන්ගේ සුබසාධනය සඳහා 1923 වසරේ දී මහනුවර ඉන්දීය දූත මණ්ඩල කාර්යාලය සුබසාධන කාර්යාලයක් ලෙස ආරම්භ වී ඇති අතර පසුව ඉන්දීය අග්‍රාමාත්‍ය ජවහල්ලාල් නේරු මහතාගේ මෙරට සංචාරයක් සමඟ එය මහනුවර ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයක් ලෙස විවෘත වී තිබේ.

# සිසුවියක් අපයෝජනය කර සැඟව සිටින පාසල් වෑන් රථ රියැදුරෙකු සොයයි

● අජිත්ලාල් ශාන්තඋදය

ඇඹිලිපිටිය නගරයේ ප්‍රසිද්ධ පාසලක එකොළොස්වන ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ පාසල් ශිෂ්‍යාවක් පාසල් වෑන් රථයක් තුළ දී අපයෝජනයට ලක් කළ බවට සැකකරන මේ වනවිට පලාගොස් සැඟවී සිටින පාසල් වෑන් රථ රියැදුරෙකු අත්අඩංගුවට ගැනීමට පොලීසිය මහජන සහාය පතයි.

16 හැවිරිදි ශිෂ්‍යාවක මෙම සිද්ධියට මුහුණදී තිබේ.

සිද්ධියට සම්බන්ධ සැකකරු 42 වියේ පසුවන දෙදරු පියෙකි. මොහු පොළොන්නරුව ප්‍රදේශයේ පදිංචිව සිට ඕමල්පේ ප්‍රදේශයෙන් විවාහ වී එහි පදිංචිව සිටි පුද්ගලයෙකි. පෙරේදා (05දා) අදාළ සිදුවීම සිදුව ඇති බවද පොලීසිය පවසයි. එම සිසුවියගේ සෙසු ළමයි කිහිපදෙනෙක් ද එම වෑන් රථයෙන් පැමිණ ඇති අතර ඔවුන් පන්තිභාර ගුරුවරියට සිද්ධිය පවසා තිබූ අතර පන්තිභාර ගුරුවරිය විදුහල්පතිනියට ද ඒ බව දන්වා ඇත.

පාසලෙන් ඇය නැවතී සිටින පුංචි අම්මාගේ ගෙදරට ඇය පාසල් නොපැමිණි බව දැනුම් තිබේ. ඇඹිලිපිටිය පොලීසියට ද මේ බව පාසලෙන් දන්වා තිබුණි. ශිෂ්‍යාව නැවතී සිටින ගෙදර අය වෑන් රථයේ රියැදුරාට දුරකථනයෙන් කතා කර විමසීමේදී කියා තිබුණේ බඩුවගයක් ගැනීමට ඔරලෝසු කණුව ළඟින් බැස්ස බවයි. ඇඹිලිපිටිය පොලීසියෙන් ද එදිනම රියදුරා ගෙන්වා ප්‍රකාශයක් ලබාගෙන තිබේ. එහිදී ද රියදුරා පවසා ඇත්තේ ශිෂ්‍යාව ඔරලෝසු කණුව ළඟින් බැස්ස බවයි. දරුවන් ආපසු ගෙන යායුතු බව පවසා රියදුරා පොලීසියෙන් ඉක්මනට පිටත්වී තිබේ.

මේ අතර එදිනම (05දාම) උදේ දහය එකොළහ වෙද්දී ශිෂ්‍යාව ආපසු නිවසට පැමිණ තිබේ. නිවැසියන් ගියේ කොහිදැයි ඇගෙන් ප්‍රශ්න කරන අතර එහිදී ද සිසුවිය සියල්ල පවසා ඇත.

පාසල් අවසන් වීමෙන් පසු රියදුරා සෙසු පාසල් ළමයින් ද, නංවාගෙන පැමිණ තිබේ. මෙම දැරියගේ පුංචි අම්මාගේ නිවස ළඟ දී කිහිපදෙනෙක් වෑන් රථයට නවත්වන ලෙස සංඥා කළ ද පාසල් දරු දැරියන් වෑන් රථයෙහි සිටියදී ම නොනවත්වා ම ඉදිරියට ධාවනය කර තිබේ. පසුව අතුරු පාරක දමා වෑන් රථය හිතවතෙකුට භාරදී ඔහු පලා ගොස් ඇත. වෑන් රථය භාරගත් තැනැත්තා දරුවන් ඔවුන්ගේ නිවෙස්වලට බස්සවා වෑන් රථයෙන් ආපසු එද්දී අතරමගදී පිරිසක් විසින් ඔහුට පහර දී ඇත. පසුව පනාමුර පොලීසියෙන් පැමිණ වෑන් රථය ඔවුන් භාරයට ගනු ලැබ ඇත.

මේ අතර 05දා සවස පාසල් සිසුවිය ඇඹිලිපිටිය පොලීසියට ගොස් සිද්ධිය සම්බන්ධයෙන් පැමිණිල්ලක් කර ඇති අතර ඇය මේ වනවිට ඇඹිලිපිටිය දිසා මහ රෝහලට ඇතුළත් කර ඇත.

සැකකරු රියදුරා ඩුබායිහි රැකියාවකට යාමට වීසා සහ ගුවන්ගමන් බලපත්‍ර ලබාගෙන තිබූ බවද වාර්තා වෙයි.

ඇඹිලිපිටිය පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර විමර්ශන පවත්වයි.

# ලක්ෂ 35ක දේපොළ කොල්ලකෑ සැකකරුවෙක් රිමාන්ඩ්

● මීගමුව බර්ටි වීරසිංහ

සීදූව පොලිස් වසමේ නිවෙස් 5කින් ලක්ෂ 35ක් පමණ වටිනා දේපොළ කොල්ලකන ලද ත්‍රිරෝද රථ රියැදුරෙකු මෙම මස 20වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස මීගමුව අතිරේක දිසාවිනිසුරු දර්ශිමා ප්‍රේමරත්න මහත්මිය ඊයේ (06දා) නියෝග කළේය.

මෙලෙස රක්ෂිත බන්ධනාගාරගත කෙරුණේ, 33 හැවිරිදි සීදූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මොහු තවත් පුද්ගලයෙකුගේ අනුදැනුම මත මෙම සොරකම් සිදු කර ඇති බවත් අදාළ කොල්ලකෑම් සැලසුම් කර දැනට පොලීසිය මගහැර සිටින අනෙක් සැකකරු නිවෙස් තුළට ඇතුළු කර ඔත්තු බැලීමේ නිරතව සිට ඇති බවට පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ.

සොරාගත් දේපොළ සැකකරු ඔහුට අයත් ත්‍රිරෝද රථයෙන්ම කොළඹ මට්ටක්කුලිය මෝදර ප්‍රදේශවලට රැගෙන ගොස් අලවිකර ඇති අතර එම දේපොළවලින් කොටසක් සොයාගෙන ඇති බව පොලීසිය පවසයි.

මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශයට ලද තොරතුරකට අනුව සදලංකාවේ ගුරුගේ වත්ත ප්‍රදේශයේදී සැකකරු අත්අඩංගුවට ගනු ලැබ තිබේ.

# සරසවි සිසුවෙකු පැහැර ගැනීමට තැත් කළැයි සරසවි සිසුන් 3ක් අත්අඩංගුවට

● බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ

පෞද්ගලික සරසවියක උපාධියක් හදාරණ 18 හැවිරිදි සිසුවෙකු මෝටර් රථයක් සමග පැහැරගෙන ඉඩමක්ද බලහත්කාරයෙන් ලියා ගැනීමට තැත් කළ පෞද්ගලික විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය ලබන සිසුන් තිදෙනෙක් අත්අඩංගුවට ගත් බව කොහුවල පොලීසිය සඳහන් කරයි.

22, 23හි පසුවන සැකකාර සිසුන් දෙහිවල, කළුබෝවිල පදිංචිකරුවෝ වෙති.

පැහැරගැනීමට ලක් වූ සිසුවා ප්‍රතිකාර සඳහා කළුබෝවිල ශික්ෂණ රෝහලට ඇතුළත් කර තිබේ. සැකකරුවන් පැහැරගත් මෝටර් රථය ද පොලිස් භාරයට ගෙන ඇත.

අදාළ සිසුවා ඉකුත් (04දා) කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළට මෝටර් රථයෙන් සිය පියාව ඇරලවා නිවසට පැමිණ අවශ්‍යතාවකට කළුබෝවිල ආසිරි මාවත නිවසින් පිටවී යමින් සිටියදී දෙහිවල නගර සභාව ආසන්නයේදී සිසුවා ගමන්ගත් ගමන්ගත් මෝටර් රථයට වෑන් රථයක් මඟ හරස් කර එයින් බැස ආ තරුණයන් සිව්දෙනෙක් මෝටර් රථය පදවාගෙන ආ සිසුවා වෑන් රථයට දමාගෙන පැහැරගෙන තිබිණි.

අනතුරුව කළුබෝවිල රෝහල ආසන්නයේ දී එම පිරිස වෑන් රථය අසල නිවසක දමා පැහැරගත් මෝටර් රථයට සිසුවා නැවත නංවාගෙන මාතලේ නිවසකට රැගෙන ගොස් එහි සිරකරගෙන සිසුවාගේ පියාට අයත් තිහාරියේ පිහිටි ඉඩම හා පැහැරගත් මෝටර් රථය ලියාදෙන ලෙස පවසමින් තර්ජනය කර තිබූ බව පොලිස් විමර්ශනවලදී අනාවරණය වී ඇත. සිද්ධියට මුහුණදුන් සිසුවා මේ බව ජංගම දුරකථයෙන් සිය මවට පැවසීමෙන් අනතුරුව මව සහ සහෝදරයා කොහුවල පොලීසියට කරන ලද පැමිණිල්ලක් අනුව සිසුවාව පැහැර ගත් කණ්ඩායමේ ප්‍රධාන සැකකරුගේ පියා පොලීසියට ගෙන්වා ඔහු ලවා සැකකරුට දුරකථන ඇමතුමක් ලබාදී උපක්‍රමශීලීව කොහුවලට ගෙන්වා ගැනීමෙන් අනතුරුව අත්අඩංගුවට ගෙන තිබේ. අදාළ සිසුවාගේ පියා හා පැහැර ගැනීම සිදු කළ කණ්ඩායමේ ප්‍රධාන සැකකරුගේ පියා මීට වසර කිහිපයකට ඉහතදී සිදුකළ හවුල් ව්‍යාපාර කටයුත්තකදී ඇති වූ මුදල් ආරවුලක් හේතුවෙන් මෙම පැහැර ගැනීම සිදු කර ඇති බව පොලිස් විමර්ශනවලදී අනාවරණය වී තිබේ. සිද්ධියට සම්බන්ධ තවත් එක් සැකකරුවෙක් අත්අඩංගුවට ගැනීමට පොලිස් විමර්ශන ක්‍රියාත්මකය.

